# 2026 වර්ෂය සඳහා වෙළඳපොළ මිල සැඳහුම් ක්‍රමය යටතේ භාණ්ඩ, සේවා සහ වැඩ කොන්ත්‍රාත් සැපයීම වෙනුවෙන් සැපයුම්කරුවන්/ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම

## කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය

## කෘෂිකර්ම අංශය

## අයදුම්කරුවන් සඳහා උපදෙස් සහ කොන්දේසි

2026 වර්ෂය සඳහා කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ - කෘෂිකර්ම අංශය වෙත වෙළඳපල මිල සැදැහුම් ක්‍රමය (Shopping Method) යටතේ භාණ්ඩ, වැඩ හා සේවා සැපයීම වෙනුවෙන් සැපයුම්කරුවන්/ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත් සහ ඊට අදාළ ලියකියවිලි 2025. 11. 20 වන දින ප. ව. 2. 00 දක්වා කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ කෘෂිකර්ම අංශයේ නිල වෙබ් අඩවිය වන www.agrimin.gov.lk වෙත පිවිස එහි මුල් පිටුවෙහි "සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම 2026 වර්ෂය" හරහා බාගත කිරීමේ හැකියාව ඇත.

සැමවිටම නිවැරදි තොරතුරු පමණක් සපයන ලෙස අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. සපයා ඇති කවර හෝ තොරතුරක් සාවද්‍ය බවට හෝ කවර හෝ වැදගත් තොරතුරක් ලබාදීමෙන් වැළකී සිටින බවට පෙනී යන්නේ නම් එවැනි අයදුම්කරුවකු ලියාපදිංචි වීම සඳහා සුදුසුකම් නොලබනු ඇත. අසම්පූර්ණ හෝ අපැහැදිළි අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

### 01. අයදුම්පත සමඟ අමුණා එවිය යුතු ලිපිලේඛන

i. නීතිඥවරයෙකු/නොතාරිස්වරයෙකු හෝ සාමදාන විනිශ්චයකාරවරයෙකු විසින් සත්‍ය බවට සහතික කරන ලද ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක්/ සමාගම් ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් (ඉහත ලිපිලේඛනවලට අදාළව 2026.01.01 දිනට වලංගු වන සේ ලියාපදිංචි නොමැති ව්‍යාපාර මේ සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් නොලබයි).

ii. සැපයුම්කරු හෝ ඔහුගේ ප්‍රධානියා නිෂ්පාදකයා නොවන අවස්ථාවක දී සැපයුම්කරු හෝ ඔහුගේ ප්‍රධානියා බලයලත් නියෝජිත හෝ බෙදාහරින්නා වන බවට නිෂ්පාදකයා විසින් ලිඛිතව සහතික කළ යුතු ය.

iii. සිවිල් ඉදිකිරීම් වැඩ සඳහා ඉල්ලුම් කරන කොන්ත්‍රාත්කරුවන් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) කුමන විශේෂිත කාණ්ඩයක්/ශ්‍රේණියක් යටතේ අවසන් වරට (2026.01.01 දිනට වලංගු වන සේ) ලියාපදිංචි වී ඇති ද යන්න තහවුරු කිරීම සඳහා එම සහතිකයේ පිටපතක් අමුණා තිබිය යුතු ය.

iv. ලියාපදිංචි වීම සඳහා අයිතම ගාස්තු ගෙවන ලද මුදල්/ බැංකු කුවිතාන්සියේ මුල් පිටපත අනිවාර්යයෙන් ම අමුණා තිබිය යුතු ය.

v. වැට් සඳහා ලියාපදිංචි වී ඇති අයදුම්කරුවන් විසින් වැට් සහතිකයේ පිටපතක් අමුණා තිබිය යුතු ය.

vi. විධිමත් පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් අවශ්‍ය සියලු ලේඛන සමඟ පහත සඳහන් ලිපිනයට **2025. 11. 20** වන දින හෝ ඊට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ පාලන හා ප්‍රසම්පාදන අංශය, **1** වන මහළ, ගොවිජන මන්දිරය, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය යන ලිපිනයට පැමිණ භාර දීම සිදු කළ යුතු ය. අයදුම්කරුවන් විසින් අයදුම්පත්‍ර බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2026"** යනුවෙන් සඳහන් කළ යුතු ය.

ලිපිනය: ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන හා ප්‍රසම්පාදන)
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
කෘෂිකර්ම අංශය,
ගොවිජන මන්දිරය,
80/5, රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

**02.** <u>අයදුම්කරුවන් සඳහා වන පොදු උපදෙස් සහ කොන්දේසි</u>

i. කරුණාකර අයදුම්කරුට අදාළ නොවන කවර හෝ අයිතමයක් ඉදිරියෙන් "අදාළ නොවේ" යන්න සඳහන් කරන්න.

ii. ලියාපදිංචි කිරීමෙන් පසුව යම් සමාගමක/ ආයතනයක තැපැල් ලිපිනයෙහි යම් සංශෝධනයක් හෝ වෙනසක් සිදු වුවහොත්, එම ඉල්ලීම සළකා බලනු ලබනුයේ එම ඉල්ලීම සමඟ එකී සංශෝධනයට සම්බන්ධ අදාළ සමාගම/ ආයතනය මඟින් නිකුත් කරන ලද සංශෝධිත සහතිකයෙහි සත්‍ය පිටපතක් ඉදිරිපත් කිරීමෙන් පමණි.

iii. ලියාපදිංචි කිරීමෙන් පසුව කවර කරුණක් යටතේ හෝ <u>අයිතම කිසිදු වෙනසක් සිදුකළ නොහැකි බව හා අයිතම අතර මාරු කිරීම් ද සිදු නොකරන බව සලකන්න</u>.

iv. අයදුම්කරුගේ යම් ප්‍රමාද දෝෂයක් හෝ අනවධානය සම්බන්ධයෙන් කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ කෘෂිකර්ම අංශය වගකීම භාර ගනු නොලැබේ.

v. එක් අයිතමයක් සඳහා, ලියාපදිංචි කිරීමේ ගාස්තු වශයෙන් රු. **1,000.00** (රුපියල් දහසයි) ආපසු නොගෙවන ගාස්තුවක් අය කරනු ලැබේ. එක් අයදුම්කරුවෙකුට අයිතම කිහිපයක් සඳහා ඉල්ලුම් කළ හැක. අයිතම ලියාපදිංචි කිරීමේ ගාස්තු **2025. 10. 31** දින සිට **2025. 11. 20** දින දක්වා කාර්යාලීය දිනවල පෙ.ව. **9.00** සිට ප.ව.**2.00** දක්වා කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ කෘෂිකර්ම අංශයේ සරප් අංශය වෙත ගෙවීමට හැකියාව ඇත.

එසේම ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් "ලේකම්, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය - කෘෂිකර්ම අංශය" ලංකා බැංකුව, බත්තරමුල්ල ශාඛාවේ ගිණුම් අංක **7040472** ගිණුමට බැර වන පරිදි ගෙවිය හැකි අතර එම මුදල් ගෙවන ලද ලදුපත ද අදාළ පෝරම සමඟ අමුණා ඉදිරිපත් කළ යුතු ය. බැංකු ගෙවීම් බැරපත නොතිබීම අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට හේතු වනු ඇත.

vi. **2026** වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමට අදාළ වැඩිදුර තොරතුරු අවශ්‍ය වුවහොත් පහත සඳහන් නිලධාරී අමතන්න (කාර්යාල වේලාවන් තුළ පමණි).

ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන හා ප්‍රසම්පාදන) - කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය - කෘෂිකර්ම අංශය

දුරකතන අංක - **011 2887406**

ෆැක්ස් - **0112887406**

vii. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය **2024** (භාණ්ඩ,වැඩ සහ උපදේශන නොවන සේවා) අංක **10.1**හි උපදෙස් ප්‍රකාරව, කොන්දේසි පැහැරහැර ඇති/ අසාධු ලේඛනගත සැපයුම්කරුවන්/ කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවෙහි නම් සඳහන් සැපයුම්කරුවන්/ කොන්ත්‍රාත්කරුවන්ට ලියාපදිංචි වීම සඳහා අවසර නොලැබේ.

viii. මිල ගණන් ඉදිරිපත් කළ පසු, සැපයීම් සඳහා අවශ්‍ය පරිදි තොග තබා ගැනීම සැපයුම්කරු/ කොන්ත්‍රාත්කරු විසින් සිදුකළ යුතු අතර, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ, කෘෂිකර්ම අංශය යටතේ, ලියාපදිංචි වන අවස්ථාවේ දී අවම වශයෙන් එක් මසක ණය පහසුකම් සැපයීමට සියලු සැපයුම්කරුවන්/ කොන්ත්‍රාත්කරුවන් ස්වයංක්‍රීයව ම එකඟවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ix. සාමාන්‍යයෙන් ලියාපදිංචි වූ සැපයුම්කරුවන්ගෙන්/ කොන්ත්‍රාත්කරුවන්ගෙන් ලංසු/ මිල ගණන් කැඳවනු ලැබේ. එසේ වුව ද අවශ්‍ය අවස්ථාවන්හි දී තෝරාගත් සීමිත සැපයුම්කරුවන්/ කොන්ත්‍රාත්කරුවන් වෙතින් හෝ වෙනත් සැපයුම්කරුවන්/ කොන්ත්‍රාත්කරුවන් වෙතින් ලංසු/මිල ගණන් කැඳවීමේ සම්පූර්ණ අයිතිය කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ, කෘෂිකර්ම අංශය සතු වේ.

x. ලේකම්, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය විසින් පත් කරනු ලබන කමිටුවක් විසින් සියලු අයදුම්පත් සළකා බලන අතර, අවශ්‍ය සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන් පමණක් ලියාපදිංචි කෙරේ. අවශ්‍ය සුදුසුකම් සතුටුදායක ලෙස සම්පූර්ණකොට නොමැති සහ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

xi. ලේකම්, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය විසින් මිල ගණන් ඉල්ලා සිටි අවස්ථාවක වාර 03ක් තුළ මිල ගණන් ඉදිරිපත් කිරීමට හා මිල ගණන් ලබා දීමට නොහැකි බව ("No Quote") දැන්වීම හෝ ඇණවුමක් නියමිත වේලාවට ක්‍රියාත්මක කළ නොහැකි හෝ ඉල්ලා සිටි අවස්ථාවක නියැදි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන හෝ සැපයුම්, පිරිවිතරයන්ට අනුකූල නොවන හෝ අනුමත නියැදියට වෙනස් සැපයුම් ඉදිරිපත් කරන හෝ සැපයුම්කරුගේ/ කොන්ත්‍රාත්කරුගේ ලියාපදිංචිය දැනුම් දීමකින් තොරව අවලංගු කරනු ඇත.

xii. 2026 වර්ෂයට සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සම්බන්ධව අවසන් තීරණය ගැනීමේ අයිතිය කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම් සතු වේ.

ලේකම්

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය

80/5,
"ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

2026 ඔක්තෝබර් මස 31වන දින

## <u>භාණ්ඩ, වැඩ හා සේවා සැපයීම සඳහා ඔබ විසින් ලියාපදිංචි විය යුතු ක්ෂේත්‍ර</u>

| (අ) කාණ්ඩය - භාණ්ඩ සැපයීම | |
|---|---|
| අයිතම අංකය | අයිතමය |
| 1. | සියලුම කාර්යාලීය ලිපි ද්‍රව්‍ය |
| 2. | පරිගණක මුද්‍රණ යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර සඳහා අවශ්‍ය උපාංග හා ලිපිද්‍රව්‍ය (ටෝනර්, කාට්රිජ්, රිබන්, තීන්ත හා කඩදාසි ආදිය) |
| 3. | සියලුම වර්ගයේ කාර්යාලීය ගෘහ භාණ්ඩ (දැව, වානේ හා වෙනත්) |
| 4. | කාර්යාලීය උපකරණ (පරිගණක යන්ත්‍ර හා උපාංග, මුද්‍රණ යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර, මල්ටි මීඩියා යන්ත්‍ර, කැමරා උපකරණ, ශබ්දවාහිනී යන්ත්‍ර හා උපාංග, රෝනියෝ යන්ත්‍ර, ගණන යන්ත්‍ර, ස්කෑනර් යන්ත්‍ර, ටැබ් යන්ත්‍ර, ඩිජිටල් තිර සියලුම ආකාරයේ ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ හා වෙනත් කාර්යාලීය උපකරණ) |
| 5. | විදුලි/ විද්‍යුත් භාණ්ඩ හා උපකරණ (වායු සමීකරණ යන්ත්‍ර, ශීතකරණ, විදුලිපංකා, විදුලි කේතල්, රූපවාහිනි යන්ත්‍ර ඇතුළු සියලුම වර්ගයේ විදුලි උපකරණ හා ඒ ආශ්‍රිත සියලු විදුලි උපාංග) |
| 6. | ජාලකරණ උපාංග |
| 7. | දුරකතන හා උපාංග (PABX, Accessories) |
| 8. | කෘෂි රසායන හා කෘෂි උපකරණ |
| 9. | අමාත්‍යාංශ පරිශ්‍රය සඳහා කාබනික පොහොර |
| 10. | i) රථ වාහන සඳහා ටයර්, ටියුබ් හා බැටරි<br>ii) වාහන වීල් එලයින්මන්ට් සහ වීල් බැලන්සින් |
| 11. | ඉදිකිරීම්/ ගොඩනැගිලි අලුත්වැඩියා සඳහා අවශ්‍ය සියලුම අමුද්‍රව්‍ය හා තීන්ත වර්ග |
| 12. | තිර රෙදි/ අභ්‍යන්තර අලංකරණ කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය |
| 13. | සිහිවටන/ රබර් මුද්‍රා සැපයීම |
| 14. | පානීය ජල බෝතල් |
| 15. | සනීපාරක්ෂක ද්‍රව්‍ය |
| 16. | කෙටි ආහාර වර්ග හා ප්‍රධාන ආහාර වේල් සැපයීම |
| (ආ) කාණ්ඩය - සේවා සැපයීම | |
| අයිතම අංකය | අයිතමය |
| 17. | පරිගණක උපකරණ හා පරිගණක උපාංග සේවා කිරීම සහ අලුත්වැඩියාව (කඩුවෙල, කොළඹ, ශ්‍රී ජයවර්ධනපුර, මහරගම නගර සභා සීමා තුළ පිහිටි ආයතන) |
| 18. | ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ හා උපාංග සේවා කිරීම හා අලුත්වැඩියාව |
| 19. | සියලුම වර්ගයේ කාර්යාලීය උපකරණ අලුත්වැඩියා කිරීම (ගෘහ භාණ්ඩ, වායු සමීකරණ යන්ත්‍ර, ශීතකරණ, විදුලිපංකා, විදුලි කේතල්, රූපවාහිනි යන්ත්‍ර ඇතුලු සියලුම වර්ගයේ විදුලි හා විද්‍යුත් උපකරණ ඇතුළුව ) |
| 20. | මුද්‍රණ සේවා (පොත්, පෝස්ටර්, ලිපි ශීර්ෂ, නාම පත්‍ර, ඩිජිටල් මුද්‍රණ කටයුතු, සහතික පත්‍ර, බැනර් මුද්‍රණය ඇතුළු සියලුම වර්ගයේ මුද්‍රණ කටයුතු) |

| | |
|---|---|
| 21. | මෝටර් වාහන (ඩීසල් සහ පෙට්‍රල්) අලුත්වැඩියාව<br>(කඩුවෙල, කොළඹ, ශ්‍රී ජයවර්ධනපුර, මහරගම නගරසභා සීමා තුළ පිහිටි ආයතන)<br>i. වාහන/ එන්ජින් අලුත්වැඩියාව (Mechanical and Electrical Repairs)<br>ii. පින්තාරු හා ටින්කරින් වැඩ<br>iii. වාහන පිරිසිදු කිරීමේ හා සේවා කිරීමේ ස්ථාන<br>iv. වාහන වායු සමීකරණ සේවා<br>v. වාහන කුෂන් කිරීම සහ අභ්‍යන්තර අලුත්වැඩියා (Interior repairs)<br>vi. විද්‍යුත් සන්නිවේදන උපාංග ( Car Audio / Video Setup and car accessories) |
| 22. | ගිනි නිවීමේ සේවා සහ නඩත්තු සේවා |
| 23. | කුලී පදනම මත වාහන ලබා ගැනීම |
| 24. | උත්සව සඳහා කුලී පදනම මත භාණ්ඩ ලබා ගැනීම (ටෙන්ට්, පුටු, මේස ආදිය) |
| 25. | ආපදා රථ සේවය |
| 26. | පිරිසිදු කිරීමේ සහ ජැනිටෝරියල් සේවා |
| 27. | කෘමි මර්දනය, වෙයන් මර්දනය සහ අනෙකුත් අහිතකර සතුන් මර්දනය |
| 28. | වාර්තාමය වැඩසටහන් නිෂ්පාදනය |
| 29. | ආරක්ෂක සේවා සැපයීම |
| 30. | විදුලි සෝපාන සේවා කිරීම සහ අලුත්වැඩියාව |
| 31. | විදුලි ජනක යන්ත්‍ර සේවා කිරීම සහ අලුත්වැඩියාව |
| 32. | ඡායාරූප මුද්‍රණය, කාර්යාලීය නිල හැඳුනුම්පත් සකස් කිරීම |
| 33. | තිර රෙදි සැපයීම, සවිකිරීම සහ අභ්‍යන්තර අලංකරණ කටයුතු |
| 34. | පරිගණක මෘදුකාංග, මෙහෙයුම් පද්ධති, ජාලකරණ හා සන්නිවේදන සේවා පහසුකම් |
| 35. | වැඩමුළු පැවැත්වීම (නව නිපැයුම්කරුවන්) |
| 36. | පර්යේෂණ කටයුතු (නව නිපැයුම්කරුවන්) |
| (ඇ) කාණ්ඩය - වැඩ | |
| අයිතම අංකය | අයිතමය |
| 37. | සිවිල් ඉදිකිරීම (සියලුම වර්ග)<br>i. ගොඩනැගිලි ඉදිකිරීම් සහ අලුත්වැඩියා කටයුතු<br>ii. මාර්ග වැඩ/ ගල් අතුරා තාර දැමීම/ නඩත්තු කටයුතු<br>iii. ජල සම්පාදන කටයුතු/ ජල නල සැදීම/ පියසි ජලාපවාහනය<br>iv. විදුලි වැඩ/ වෑල්ඩින් වැඩ සහ නඩත්තු කටයුතු<br>v. යාන්ත්‍රික වැඩ/අලුත්වැඩියා කටයුතු සහ නඩත්තු කටයුතු<br>vi. ඇලුමිනියම් වැඩ/ ඇලුමිනියම් සවි කිරීම සහ වීදුරු වැඩ<br>vii. අභ්‍යන්තර අලංකරණ කටයුතු<br>viii. වැට ඉදිකිරීම සහ නඩත්තු කටයුතු |
| 38. | කුඩා ප්‍රමාණයේ ඉදිකිරීම් හා නඩත්තු කටයුතු සමඟ කම්කරුවන් සැපයීමේ කටයුතු |
| 39. | නාම පුවරු, සංඥා පුවරු, සමරුඵලක, පැනල ආදිය සැපයීම සහ සවි කිරීම |
| 40. | මලඅපවහන/ ජලාපවාහනය/ කැලි කසල බැහැර කිරීම සහ නඩත්තු කටයුතු |
| 41. | CCTV කැමරා පද්ධති සැපයීම සහ සවි කිරීම |

# The List of Categories and Items are given below.

| Category (A ) - Goods | |
|---|---|
| **Item No.** | **Item** |
| **01** | All Office Stationary |
| **02** | Accessories and stationary required for Computer Printers, Photocopiers, Fax Machines (Toner Cartridges, Ribbon, Ink and Paper etc.) |
| **03** | All kind of Office Furniture (Wood, Metal, etc…) |
| **04** | Office Equipment ( Computers and Accessories, Printers, Photocopiers , Fax Machines, Multi Media Projectors, Camera Equipment , Sound systems and Accessories, Roneo Machines , Calculators, Scanners, Tabs, Digital Screen, All kind of Audio and Video equipment and Other Office Equipment ) |
| **05** | Electric/ Electronic Items and Equipment (Air Conditioner, Refrigerators, Fans, Electric Kettles, Televisions and all kind of Electric Equipment and Accessories. |
| **06** | Networking Accessories |
| **07** | Telephone and Accessories (PABX, Accessories) |
| **08** | Agro Chemical and Agro Equipment |
| **09** | Organic Fertilizer for Ministry Premises |
| **10** | i) Tires, Tubes and Batteries for vehicles.<br>ii) Wheel Alignment and Wheel Balancing of Vehicles |
| **11** | Material and Paint required for construction / Building Renovation |
| **12** | Material required for Curtaining / Interior Designing |
| **13** | Souvenirs / Rubber Seals |
| **14** | Portable Drinking Water Bottles |
| **15** | Sanitary Products |
| **16** | Providing Snacks and Main Meals |
| **Category (B ) - Services** | |
| **Item No** | **Item** |
| **17** | Servicing and Repairing Computer Devices and Computer Accessories (Institution within the limits of Kaduwela, Colombo, Sri Jayawardanapura Kotte, Maharagama Urban Councils) |
| **18** | Servicing and Repairing Audio and Visual Equipment |
| **19** | Repairing all kinds of office equipment ( Furniture, Air Conditioners, Refrigerators, Fans, Electric Kettles, Televisions and all kinds of Electric and Electronic Equipment ) |
| **20** | Printing Services (Books, Posters, Letter heads, Name Cards, Digital Printing Work, Printing of Banners and all kinds of Printing Work) |

| | |
|---|---|
| **21** | Repairing of Motor Vehicles (Diesel and Petrol)<br>(Instructions within the limits of Kaduwela, Colombo, Sri Jayawardanapura Kotte, Maharagama Urban Councils)<br>i. Vehicle/ Mechanical and Electrical Repairs,<br>ii. Paint and Tinkering work<br>iii. Vehicle Service Center<br>iv. Vehicle Air Conditioning Services<br>v. Vehicle Cushioning and Interior Repairs.<br>vi. Car Audio/ Video Setup/ Car accesseries (Tinted, door visor,Sunvisor etc....) |
| **22** | Fire Extinguishing Services and Maintenance Services |
| **23** | Provision of Vehicles on Hire |
| **24** | Supply of Goods for Events on Hire (Tents, Chairs, Tables etc.) |
| **25** | Emergency Vehicle Services |
| **26** | Cleaning and Janitorial Services |
| **27** | Pest Control |
| **28** | Production of Documentaries |
| **29** | Security Services |
| **30** | Lift Maintenance and repairs |
| **31** | Generator Maintenance and repairs |
| **32** | Photo Printing and Preparation of Official IDs |
| **33** | Curtaining and Interior Designing |
| **34** | Computer Software , Networking and Communication Service Facilities |
| **35** | Conducting workshops and Trainings (For Inventors) |
| **36** | Testing (For Inventors) |
| **3Category ( C) – Work** | |
| **Item No** | **Item** |
| **37** | Civil Constructions ( All Types)<br>i. Construction and Renovation of Building<br>ii. Road Work / Laying Gravel and Tar / Maintenance<br>iii. Water Supply/ Plumbing/ Roof Drainage<br>iv. Electric Work / Welding and Maintenance<br>v. Mechanical Work / Repairs and Maintenance<br>vi. Aluminum Work / Fixing Aluminum and Glass Work<br>vii. Interior Designing<br>viii. Construction of Fence and Maintenance |
| **38** | Provision of workers for small – scale construction and maintenance activities |
| **39** | Supply and Fixing of Name Boards, Sign Boards, Panels, Commemorative Plaques |
| **40** | Drainage / Disposal of Garbage and Maintenance |
| **41** | Supply and Fixing of CCTV Camera |